# විමසිලිමත් වන්න!

# ඉඩකඩම් සහ දේපළ ත්‍රස්තවාදී කටයුතු උදෙසා යොදා ගත හැකිය

## අවධානය යොමු කරන්න!

ඉඩකඩම් සහ දේපළ සම්බන්ධ ගනුදෙනුවල නිරත වීමේදී පහත සඳහන් වැදගත් කරුණු පිළිබඳව අවධානය යොමු කරන්න.

- ගනුදෙනුව පැවැත්වීමට අදහස් කරන පුද්ගලයා, පුද්ගල කණ්ඩායම හෝ ආයතනය පිළිබඳ මැනවින් තොරතුරු රැස් කර එම තොරතුරු වලංගු නෛතිකමය ලියවිල්ලක් මගින් තහවුරු කර ගැනීම.
- ඉඩකඩම් සහ දේපළ විකිණීමේ හෝ මිලදී ගැනීමේ හේතුව විමසා බැලීම.
- ඉඩකඩම් සහ දේපළ මිලදී ගැනීම සඳහා යෙදවූ මුදල් උපයාගත් ආකාරය පිළිබඳව විමසා බැලීම.
- පවතින වෙළෙඳපොළ වටිනාකමට වඩා වැඩි මිලක් ඉඩකඩම් සහ දේපළ සඳහා ගෙවන්නේ නම්, ඒ පිළිබඳව විමසිලිමත් වීම.
- ගනුදෙනුකරු පිළිබඳ දන්නා තොරතුරු හෝ ඉඩකඩම්, දේපළ මිලදී ගැනීමට ඔහු/ඇය හට පවත්නා ආර්ථික හැකියාව සමඟ අදාළ මිලදී ගැනීම ගැලපෙන්නේදැයි විමසා බැලීම.
- ගනුදෙනු පවත්වන පුද්ගලයා, පුද්ගල කණ්ඩායම හෝ ආයතනය ඔබ විසින් ඉල්ලා සිටින තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේනම් ඒ පිළිබඳව ඔබ සතු තොරතුරු ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම.

## සැක කටයුතු ක්‍රියාවන් වාර්තා කරන්න

ඔබ ඉඩකඩම් සහ දේපළ සම්බන්ධ ගනුදෙනුවක නිරත වන විට දී, ගනුදෙනු පවත්වන පුද්ගලයා, පුද්ගල කණ්ඩායම හෝ ආයතනය යම් නීති විරෝධී ක්‍රියාවක (ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාවන්ද ඇතුළුව) නිරත වන බවට සැකයක් හෝ සැක කිරීමට හේතු ඇතිනම් ඒ පිළිබඳව වහාම ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමේ වගකීමක් ඇත.


**ලිපිනය:**
අධ්‍යක්ෂ,
මූල්‍ය බුද්ධි ඒකකය,
ශ්‍රී ලංකා මහ බැංකුව,
අංක 30, ජනාධිපති මාවත,
කොළඹ 01.

**දු.අ:** +94 11 2477125/509
**ෆැක්ස්:** +94 11 2477692
**ඊමේල්:** fiu@cbsl.lk
**වෙබ් අඩවිය:** www.fiusrilanka.gov.lk


**සැකකටයුතු ගනුදෙනු වාර්තා කිරීම සඳහා V වන උපලේඛනය බාගත කර ගන්න:**

http://www.fiusrilanka.gov.lk/docs/Regulations/2015-56/2015-56(E).pdf

- 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ නියෝග යටතේ ඉහත වගකීම් වෙත ඔබේ අවධානය යොමු විය යුතුවේ.
- සැක කටයුතු ගනුදෙනු වාර්තා කරන තැනැත්තන් ඉහත පනතේ 12 වන වගන්තිය මගින් ආරක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මූල්‍ය බුද්ධි ඒකකය
நிதியியல் உளவறிதல் பிரிவு
FINANCIAL INTELLIGENCE UNIT